**ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර I (බී) ව්‍යාපෘතිය - 2018**

---

ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර I (බී) ව්‍යාපෘතියේ 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල අතර 2011 දෙසැම්බර් 20 දින එළඹි අංක 836 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රාදේශීය හා ජාතික අවශ්‍යතා අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් පිළිබිඹු වන පරිදි උපාධි පාඨමාලා වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම මෙන්ම ශිෂ්‍ය හා ආචාර්ය මණ්ඩල නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම හා විනෝද හා සුභසාධක පහසුකම් සැපයීම සමග සුදුසු අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් හා නව අවශ්‍යතාවයන්ට සරිලන උපාධි වැඩසටහන් හඳුන්වාදීම තුලින් හා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම තුලින් ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයට හා ආර්ථික වර්ධනයට උපකාරී වීමට ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කයේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,812 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3.5 ක් වන අතර ඉන් රු.මිලියන 1,421 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3 ක් අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල මගින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. එහි කටයුතු 2012 සැප්තැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර, 2018 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2019 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2018 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය වාර්තාව, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය වාර්තාව පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය වාර්තාවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

සපයා තිබූ තොරතුරු ප්‍රකාරව, ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත වූ ලද ජල විද්‍යා පරීක්ෂණාගාරය, පොදු ආපන ශාලාව, අධ්‍යාපන වැඩසටහන් මධ්‍යස්ථානය, සම්මන්ත්‍රණ ශාලාව හා ඔලුවිල් ශිෂ්‍ය නේවාසිකාගාර වැනි ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හා ක්‍රීඩාපිටිය ඉදිකිරීම හා ක්‍රීඩාගාරය තවදුරටත් වැඩිදියුණු කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. ශ්‍රවණාගාරයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු 2018 මැයි මස 31 දින අවසන් කර තිබුණි.

### 2.2 භාවිතයට නොගත් මූල්‍ය සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ලබා දෙනු ලැබූ ණය මුදලින් රු. මිලියන 53.70 කට සමාන කුවේට් ඩිනාර් 91,502 ක ප්‍රමාණය 2018 සැප්තැම්බර් 30 දිනට වියදම් නොකර ඉතිරිව තිබුණි. | අරමුදල් වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට ඉඩ තිබීම. | භාවිතා නොකළ ණය ශේෂය සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2018 ඔක්තෝබර් 09 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීමක් සිදුකර තිබුණි. | (අ) ලබා දුන් ණය මුදලින් ඉතිරිවීම් සඳහා හේතු විමර්ශනය කළයුතු විම.<br>(ආ)අරමුදල් ඵලදායි ආකාරයෙන් භාවිතා කිරිමට කටයුතු කළ යුතු වීම. |

### 2.3 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2019 පෙබරවාරි 06 දිනැති ලිපිය ප්‍රකාරව ව්‍යාපෘති කාලය 2019 සැප්තැම්බර් මස 30 වන දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවුවත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 30 වන දින දක්වා වන මාස 09 ක කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘතියේ මූල්‍ය වර්ෂය සඳහා වන පදනම අඛණ්ඩව යොදාගෙන නොමැති වීම. | පිළිතුරු ලබා දී නොමැත. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 03 ක කාලපරිච්ඡේදය සහ ඊට පසු වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |